# ශ්‍රී ලංකාවේ ළමා ලිංගික අපයෝජන අවම කිරීමට අන්තර්ජාලයේ ඇති ශක්‍යතාව සහ පවත්නා නීති පිළිබඳ අධ්‍යයනයක්.

එච්.ඩී.ඊ. ගුණසේකර

FGS/03/02/06/2013/01

| | |
|---|---|
| ප්‍රවේශ අංකය: | 1181 |
| වර්ග අංකය: | |

කැලණිය විශ්වවිද්‍යාලයේ පශ්චාත් උපාධි පීඨයේ ජනසන්නිවේදනය පිළිබඳ දර්ශනපති උපාධිය සඳහා ඉදිරිපත් කරන ලදි.

2015 මාර්තු

# නිබන්ධ සාරාංශය

ශ්‍රී ලංකාවේ ළමා ලිංගික අපයෝජන අවම කිරීමට අන්තර්ජාලයේ ඇති ශක්‍යතාව සහ පවත්නා නීති පිළිබඳ අධ්‍යයනයක් නම් මෙම පර්යේෂණයේ ප්‍රධාන ගැටලුව වූයේ, මෙරට ළමා ලිංගික අපයෝජන අවම කිරීම සඳහා අන්තර්ජාලය භාවිතා කළ හැකි ද? එසේ භාවිතා කළ හැකි නම් ඒ කවර ආකාරයෙන්ද? යන්නයි. ඒ අනුව අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ වුයේ ශ්‍රී ලංකාවේ ළමා ලිංගික අපයෝජන අවම කිරීම සඳහා අන්තර්ජාලය භාවිත කිරීමේ හැකියාව පිළිබඳව සොයා බැලීමයි.

එමෙන්ම පර්යේෂණයට අදාළව දත්ත රැස්කිරීම සඳහා ප්‍රධාන වශයෙන් පර්යේෂණ ක්‍රමවේදයන් 04ක් භාවිත කරන ලදි. ඒ ප්‍රශ්නමාලා ක්‍රමය, සම්මුඛ සාකච්ඡා ක්‍රමය, සිද්ධි අධ්‍යයන ක්‍රමය හා අන්තර්ජාලය සමඟ සම්බන්ධතා පැවැත්වීම වශයෙනි. ප්‍රශ්නමාලා ක්‍රමය යටතේ ස්ත්‍රී පුරුෂ භේදය සමානුපාතිකව වයස අවුරුදු 14-65ත් අතර පාසල් පදනම, විශ්වවිද්‍යාල පදනම, අන්තර්ජාල සන්නිවේදන මධ්‍යස්ථාන පදනම, සිවිල් සංවිධාන පදනම හා සාමාන්‍ය ජනතා පදනම මත අහඹු ලෙස තෝරාගත් පන්සිය දෙනෙකුගෙන් තොරතුරු ලබාගත් අතර, සම්මුඛ සාකච්ඡා ක්‍රමය යටතේ විෂයට අදාළ ප්‍රවීණ සම්පත්දායකයන් 09 දෙනෙකු හා සාකච්ඡා කිරීමෙන් තොරතුරු ලබාගන්නා ලදි. එමෙන්ම සිද්ධි අධ්‍යනයන් 09ක් ඔස්සේ හා Facebook, Twitter, Email, YouTube වැනි අන්තර්ජාලය සතු විවිධ දේ ඔස්සේද සම්බන්ධතා පවත්වමින් පර්යේෂණයට අදාළව තොරතුරු ලබාගන්නා ලදි.

ශ්‍රී ලංකාවේ ළමා ලිංගික අපයෝජන අවම කිරීමට අන්තර්ජාලයේ ඇති ශක්‍යතාව සහ පවත්නා නීති පිළිබඳ අධ්‍යයනයක් නම් මෙම පර්යේෂණයේදී උක්ත පර්යේෂණ ක්‍රමවේදයන් උපයෝගී කරගනිමින් උත්සාහ දරනු ලැබුවේ පර්යේෂණයේ ප්‍රධාන අරමුණ ඇතුළු උප අරමුණුද සාක්ෂාත් කරගනිමින් පර්යේෂණයේ උපන්‍යාසය සනාථ කර ගැනීමටයි. ඒ අනුව පර්යේෂණයේ උපන්‍යාසයද සනාථ කර ගනිමින් එළඹි ප්‍රධාන නිගමනය වූයේ, "ශ්‍රී ලංකාවේ ළමා ලිංගික අපයෝජන අවම කිරීම කෙරෙහි අන්තර්ජාලය ඵලදායී ජනමාධ්‍යයක් ලෙස භාවිත කළ හැක" යන්නයි. එහිදී දෙවන ඡේදයේ සඳහන් කළ අන්තර්ජාලය සතු හැකියාවන්ට අමතරව ප්‍රවෘත්ති වෙබ් අඩවි හා වෙනත් ජනප්‍රිය වෙබ් අඩවි, Popup Advertisment, Web Redio, Web Tv, Skype, Viber, Blog, Ftp, Voice Mail, Email වැනි හැකියාවන්ද උපයෝගී කර ගනිමින් ළමා ලිංගික අපයෝජකයන්ගෙන් ආරක්ෂාවීම පිළිබඳව ළමුන් දැනුවත් කෙරෙන තොරතුරු හා ළමුන් ඉන් ආරක්ෂා කිරීම පිළිබඳව වැඩිහිටියන් දැනුවත් කෙරෙන තොරතුරු සමාජගත කළ හැකිය. එහිදී ළමා ලිංගික අපයෝජන, එවැනි සිද්ධීන්ට මුහුණාදුන් ළමුන් තුළ පෙන්නුම් කරන ලක්ෂණ, ළමුන් ලිංගික අපයෝජනයට ලක්විය හැකි ස්ථාන, ළමා ලිංගික අපයෝජකයන්ගේ ස්වාභාවය, ළමා ලිංගික අපයෝජන වලට අදාළ දඬුවම, ළමයින් ලිංගික අපයෝජන වලින් ආරක්ෂා කර ගැනීමට ගතයුතු ක්‍රියාමාර්ග, ලිංගික අපයෝජන වලින් ආරක්ෂාවීමට ළමයින් දැනගත යුතු කරුණු, ළමා ලිංගික අපයෝජන පිළිබඳව දැනුම්දිය යුතු ආයතන වැනි කරුණු රැසක් සමාජ ගත කළ හැක. විශේෂයෙන් ශ්‍රී ලංකාවේ ළමා ලිංගික අපයෝජන අවම කිරීම කෙරෙහි අන්තර්ජාලය භාවිත කළ හැකි අන්දම පිළිබඳවද යෝජනාවලියක්ද පර්යේෂණය තුළදී ඉදිරිපත් කරන ලදි. ළමා ආරක්ෂාව පිළිබඳව පුළුල් සමාජ කථිකාවක් නිර්මාණය කිරීමටද පර්යේෂණය තුළදී හැකි වූ අතර එය සාධනීය ලක්ෂණයක් ලෙසද දැක්විය හැකිය. පර්යේෂණයට අදාළ මුඛ්‍ය පද,

- ලිංගික අපයෝජන
- අන්තර්ජාලය
- ශක්‍යතාවය
- නීති
- ළමයින්